// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2190/21 - 2020 අගෝස්තු මස 24 වැනි සඳුදා - 2020.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 7/3/1/2-10.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගොඩ උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, හෝමාපොල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අ. ග. පි. 42හි අති. 13 පත්‍ර අංක 14හි කැබලි අංක 431 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0579ක පමණවන "ඇහැලේපොල වත්ත" නමැති ඉඩම් කැබැල්ලට මායිම් :

*උතුරට* : කැබලි අංක 432; *නැගෙනහිරට* : කැබලි අංක 432; *දකුණට* : කැබලි අංක 432 සහ මොරගස්පිටිය (අගපි 33); *බටහිරට* : මොරගස්පිටිය (අගපි 33).

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගොඩ උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, මොරගස්පිටිය ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අ. ග. පි. 33හි අති. 19 පත්‍ර අංක 18 හි කැබලි අංක 373 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0054 ක් පමණ වන "ඇහැලේපොල වත්ත" නමැති ඉඩම් කැබැල්ලට මායිම් :

*උතුරට* : කැබලි අංක 254; *නැගෙනහිරට* : හෝමාපොල (අගපි 42); *දකුණට* : කැබලි අංක 254; *බටහිරට* : කැබලි අංක 254.

මහජන කටයුත්ත කුමක්ද යන වග - විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ වල්මෝරුව ජල ටැංකිය ඉදිකිරීම සඳහා විකල්ප ඉඩම් කොටසක් අත්කර ගැනීම.

හිමිකම් කියන අය: බස්නායක මුදියන්සේලාගේ නිලව ගෙදර දයානන්ද මයා, හෝමාපොල ජනපදය, නාලන්ද.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 නොවැම්බර් මස 18 වැනි දින පූ. භා. 10.00 ට පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 ඔක්තෝබර් මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එච්. එම්. සී. ඒකනායක,**
ප්‍රාදේශීය ලේකම්,
පල්ලේපොල.

2020 අගෝස්තු මස 20 වැනි දින,
පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-194

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.